(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 126.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2011 සැප්තැම්බර් මස 23 වැනි සිකුරාදා අ. භා. 1.30 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0330/'10

1.

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) පසුගිය වර්ෂ 20 ක කාලය තුළ මහාමාර්ග ඉදි කිරීම සඳහා වාර්ෂිකව පවරා ගත් ඉඩම් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා ගෙවිය යුතු වන්දි ප්‍රමාණය කොපමණද;

(iii) එයින් දැනටමත් ගෙවා ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) තවදුරටත් ගෙවීමට ඇති මුදල කොපමණද;

(v) එම මුදල් ගෙවා නිමකරන්නේ කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0763/'10

2.

ගරු රවී කරුණානායක මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) "එයාර් ලංකා" ගුවන් සේවය පෞද්ගලීකරණය කරන ලද දිනය සහ එහි වටිනාකම කවරේද;

(ii) "ශ්‍රී ලංකන් එයාර්ලයින්" සමාගමේ කොටස් යළි හිමිකරගත් දිනය සහ ඒ සඳහා වැයවූ මුදල් ප්‍රමාණය කවරේද;

(iii) කළමනාකාරීත්වය පවරාගත් දින සිට "ශ්‍රී ලංකන් එයාර්ලයින්" සමාගමට ප්‍රතිපාදිත මුදල් ප්‍රමාණයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) "ශ්‍රී ලංකන් එයාර්ලයින්" සමාගම විසින් ලබාගෙන ඇති ණය මුදල්වල වටිනාකම කොපමණද;

(ii) එකී ණය මුදල් ලබාගත් දිනයන් සහ එම ණය මුදල් ලබාගත් ආයතනවල නම් කවරේද;

(iii) වර්ෂ 2010 සිට 2017 දක්වා ශ්‍රී ලංකන් එයාර්ලයින් සමාගමේ ණය සේවාකරණය වාර්ෂික පදනමින් කොපමණද;

(iv) 2005 සිට 2011 වර්ෂය දක්වා "ශ්‍රී ලංකන් එයාර්ලයින්" සමාගම ලැබූ ලාභය හෝ පාඩුව කොපමණද;

(v) පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී භූමියේදි සිදුකළ භාණ්ඩ මෙහෙයුම් තුළින් ලැබූ ලාභය කොපමණද;

(vi) "ශ්‍රී ලංකන් එයාර්ලයින්" සමාගමට අදාළව රජය විසින් ලබාදී ඇති බැංකු ඇපකර පිළිබඳ විස්තර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0801/'10

3.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ රජය මගින් පාලනය වන ජාතික පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) එම පාසල් අතරින් ගුරු අතිරික්තයක් පවතින පාසල් කවරේද;

(iv) ගුරු අතිරික්තයක් පවතින විෂයයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම පාසල්වලින් ගුරු ඌනතා පවතින පාසල් කවරේද;

(ii) ගුරු ඌනතාවයන් පවතින විෂයයන් කවරේද;

(iii) ගුරු ඌනතා පවතින පාසල්වලට ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1215/'11

4.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ජනාධිපති අරමුදලට මුදල් ආධාර ලැබෙන ආකාරය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2008, 2009 සහ 2010 වර්ෂයන්හිදී, වෙන් වෙන් වශයෙන්,

(i) ජනාධිපති අරමුදලට වෙන් කරන ලද මුදල කොපමණද;

(ii) එම අරමුදලින් ලබාදුන් ආධාරවල එකතුව කොපමණද;

(iii) ජනාධිපති අරමුදලින් ආධාර ලබා දෙන ක්ෂේත්‍ර හා එක් එක් ක්ෂේත්‍රය වෙනුවෙන් ලබා දුන් මුදල් ප්‍රමාණය කවරේද;

(iv) ආධාර ලබා දුන් අයගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1539/'11

5.

ගරු අජිත් කුමාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හබරාදුව අධ්‍යාපන කොට්ඨාසයට අයත්, පුස්සැල්කඩ ආදර්ශ කණිටු විදුහලේ වර්ෂ 2003 සිට 2010 දක්වා, එක් එක් වර්ෂය ආරම්භයේදී,

(i) ඒ ඒ ශ්‍රේණිවල සිටි සිසුන් සංඛ්‍යාව හා සම්පූර්ණ ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(ii) ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) පළමුවැනි ශ්‍රේණියට අයදුම්පත් යොමුකළ ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2004 න් පසු එම පාසලේ ප්‍රගතියක් ඇති වී තිබෙන බව පිළිගන්නේද;

(ii) එම ප්‍රගතිය සඳහා හේතු වූ කරුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1542/'11

6\. ගරු වසන්ත අලුවිහාරේ මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, දඹුල්ල නගරය මැදින් ගලා බසින තම්මැන්නා ඇළ පළල් කිරීමේ කටයුතු සිදුකරන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(ii) එම ව්‍යාපෘතියේ කටයුතු සිදු කරන ආයතනය කුමක්ද;

(iii) තම්මැන්නා ඇළ පළල් කිරීමේ කටයුතු පිළිබඳව ප්‍රදේශවාසීන් දැනුවත් කර තිබේද;

(iv) ඇළ පළල් කිරීම හේතුවෙන් ඇළ දෙපස පදිංචිකරුවන් විශාල පිරිසකගේ සින්නක්කර ඉඩම් කොටස් සහ එම ඉඩම්වල තිබූ වටිනා ගස් අහිමි වී ඇති බව පිළිගන්නේද;

(v) එසේ නම්, එම පදිංචිකරුවන්ට ඒ සඳහා වන්දි මුදලක් ලබා දීමට කටයුතු කරන්නේද;

(vi) වන්දි ලබා දීමට කටයුතු කරන්නේ නම්, ඊට ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1616/'11

7\. ගරු මොහොමඩ් අස්ලම් මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුරය දිස්ත්‍රික්කයේ, කැකිරාව, ගනේවල්පොල ප්‍රදේශයේ උග්‍ර පානීය ජල හිඟයක් පවතින බවත්;

(ii) එම ප්‍රදේශයේ උල්පත් ජලය හා ළිං ජලය පානය කිරීමට නුසුදුසු බවට සෞඛ්‍ය නිලධාරීන් උපදෙස් දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) කලාවැව ජල යෝජනා ක්‍රමය යටතේ ජල නල එළීමේ කටයුතු ඉහත සඳහන් ප්‍රදේශයන්හි ගම්මානයන් ආවරණය වන පරිදි ව්‍යාප්ත නොකිරීම නිසා එම ප්‍රදේශවාසීන්ට පිරිසිදු පානීය ජල පහසුකම් ලබා ගැනීමේ අවස්ථාව අහිමිවී තිබෙන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, එම ජනතාවගේ පානීය ජල අවශ්‍යතාවය සපුරාලීම සඳහා කඩිනම් විසඳුමක් ලබා දෙන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0770/'10

8.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2009 හා 2010 යන වර්ෂවලදී,

(i) මත්පැන් බලපත්‍ර නිකුත්කර තිබේද;

(ii) එසේ නම්, විවිධ කාණ්ඩ යටතේ නිකුත් කොට ඇති බලපත්‍ර සංඛ්‍යාව කවරේද;

(iii) නිකුත් කරන ලද නව බලපත්‍ර සංඛ්‍යාව දිස්ත්‍රික් පදනමින් කවරේද;

(iv) මත්පැන් බලපත්‍ර නිකුත් කිරීමෙන් උපයාගත් ආදායම කොපමණද;

(v) එම බලපත්‍රවලින් කිසිවක් අවලංගු කොට තිබේද;

(vi) එසේ නම්, එලෙස අවලංගු කරන ලද මත්පැන් බලපත්‍ර කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0812/'10

9.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, දෙනියාය කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, කොටපොල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌනතාවයන් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම පාසල් පද්ධතිය තුළ ඇති,

(i) විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව;

(ii) පුස්තකාල සහ විද්‍යාගාර පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව;

(iii) ගුරු නිවාස සංඛ්‍යාව;

(iv) විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත අඩුපාඩු සහිත පාසල්වල නම්, ලිපිනයන් සහ දුරකථන අංක කවරේද;

(ii) එම අඩුපාඩු සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කරදීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0984/'10

10.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ගොවිජන සේවා හා වන ජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(ආ) (i) විල්පත්තු අභය භූමිය තුළ වැලි ගොඩ දැමීමක් සිදුවී තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා ලබා දී ඇති අවසර පත්‍රය ඉදිරිපත් කරන්නේද;

(iii) එම බලපත්‍රය ලබා දුන් බලධාරියා කවරුන්ද;

(iv) එම බලපත්‍රය මගින් වැලි ඉවත් කිරීමට අවසර ලැබී ඇති පුද්ගලයා හෝ පුද්ගලයින් කවරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම අභය භූමියෙන් මේ වන විට ඉවත් කර ඇති වැලි ප්‍රමාණය කොපමණද;

(ii) එම වැලි කවර කටයුත්තක් සඳහා රැගෙන යනු ලබන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1217/'11

11.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසුගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1193/'11

12.

ගරු රවී කරුණානායක මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය වර්ෂ පහ තුළ, එක් එක් වර්ෂයේ දී,

(i) සමස්ත වියළි මිරිස් පරිභෝජනය සහ ඒක පුද්ගල වියළි මිරිස් පරිභෝජනය කොපමණද;

(ii) දේශීය වශයෙන් නිෂ්පාදනය කළ වියළි මිරිස් ප්‍රමාණය කොපමණද;

(iii) ශ්‍රී ලංකාව තුළ වියළි මිරිස් කිලෝග්‍රෑමයක් සඳහා වන නිෂ්පාදන වියදම කොපමණද;

(iv) ආනයනය කළ වියළි මිරිස් ප්‍රමාණය කොපමණද;

(v) ආනයනය කරන ලද වියළි මිරිස් ප්‍රමාණයේ වටිනාකම කොපමණද;

(vi) රජය මගින් වියළි මිරිස් සඳහා සත්‍ය වශයෙන්ම ලබා දෙන සහනාධාරය, එය සනාථ කිරීමට අවශ්‍ය කරුණුද සමග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ආනයනය කරන ලද සහ දේශීයව නිෂ්පාදනය කරන ලද වියළි මිරිස් කිලෝග්‍රෑමයක් සඳහා පනවා ඇති සියලු බදු (සෘජු සහ වක්‍ර) වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1271/'11

13.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1275/'11

14.

ගරු බුද්ධික පතිරණ මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) බදුල්ල දිස්ත්‍රික්කයේ, හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, බෙරගල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ප්‍රජා ජල ව්‍යාපෘතියේ වැඩ අතරමග නතර කිරීම නිසා ප්‍රදේශයේ ජනතාව අපහසුතාවයට පත්ව සිටින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ප්‍රජා ජල ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා අරමුදල් සපයනු ලබන ආයතනය කවරේද;

(ii) ඒ සඳහා වෙන්කර ඇති මුළු මුදල කොපමණද;

(iii) එම ව්‍යාපෘතිය නවතා දැමීමට හේතු කවරේද;

(iv) එහි ඉදිකිරීම් සම්බන්ධයෙන් පවතින බාධා කඩිනමින් ඉවත් කොට ඉදිකිරීම් නැවත අරඹා ජනතාවගේ ජල අවශ්‍යතා සපුරාලීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1340/'11

15.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂයේ රජයේ පාසල්වල ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් අතරින් නොමිලේ පාසල් නිල ඇඳුම් ලබා දෙන සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනවිට 2011 වර්ෂය සඳහා පාසල් නිල ඇඳුම් ලබා දී තිබේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(v) ලබා දී නොමැති නිල ඇඳුම් ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2011 ඔක්තෝබර් මස 06 වැනි බ්‍රහස්පතින්දා අ. භා. 1.00 වන තෙක් කල් තැබිය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත

*1.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත,— දෙවැනි වර කියවීම.

*4.

වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — කාරක සභාව

*6.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව

*7.

සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

විදේශ සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*9.

විශ්‍රාම වැටුප් (ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.

සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*11.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2008,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2010.06.11 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*12.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2008,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2010.09.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*13.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමිය,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව 2008,— 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය අනුව 2010.12.03 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික හා තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*14.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව 2008,— 1969 අංක 19 දරන පරමාණුක ශක්ති අධිකාරි පනතේ 34 වගන්තිය අනුව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය අනුව 2010.06.30 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය.

(විදුලිබල හා බලශක්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*15.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 5 ආ සහ 5 ඇ වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 25 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලද සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් අනුමත කරන ලදුව 2010 ඔක්තෝබර් මස 27 දිනැති, අංක 1677/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.01.04 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*16.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරිය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2011 සැප්තැම්බර් 08),— "2007 අංක 42 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 30 දිනැති අංක 1708/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය."

යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

19.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

20.

බලන බුද්ධ ප්‍රතිමා නිර්මාණ සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

0811/'10

1.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, දෙනියාය කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, කොටපොල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) එම පාසල්වලින් සිසුන් සියයට අඩු පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයේ ගුරු අතිරික්තයක් ඇති පාසල් තිබේද;

(ii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) ගුරු ඌනතා පවතින පාසල්වල නම් කවරේද;

(iv) ගුරු ඌනතාවයන් පවතින විෂයයන් කවරේද;

(v) එම ගුරු ඌනතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(vi) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0813/'10

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, දෙනියාය කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, පස්ගොඩ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌනතාවයන් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම පාසල් පද්ධතිය තුළ ඇති,

(i) විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව;

(ii) පුස්තකාල සහ විද්‍යාගාර පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව;

(iii) ගුරු නිවාස සංඛ්‍යාව;

(iv) විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත අඩුපාඩු සහිත පාසල්වල නම්, ලිපිනයන් සහ දුරකථන අංක කවරේද;

(ii) එම අඩුපාඩු සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කරදීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0815/'10

3.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, මාතර කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, දෙවිනුවර කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) එම පාසල්වලින් සිසුන් සියයට අඩු පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

(v) දැනට වසා දැමීමට තීරණය කර ඇති පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයේ ගුරු අතිරික්තයක් ඇති පාසල් තිබේද;

(ii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) ගුරු ඌනතා පවතින පාසල්වල නම් කවරේද;

(iv) ගුරු ඌනතාවයන් පවතින විෂයයන් කවරේද;

(v) එම ගුරු ඌනතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(vi) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1151/'11

4.

ගරු බුද්ධික පතිරණ මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ,

(i) 2005 සිට 2010 දක්වා සෑම වර්ෂයකම ජූනි මස 30 වැනි දින දක්වා හිමිකම් ලැබූ සමෘද්ධිලාභීන් සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වර්ෂ 2005 සිට 2010 දක්වා සමෘද්ධිලාභීන් වෙනුවෙන් වාර්ෂිකව වෙන් කරන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2005 සිට 2009 දක්වා සමෘද්ධිලාභීන්ව සිට ඉවත් කරන ලද අයගේ නම් හා ලිපිනයන් කවරේද;

(iv) එසේ ඉවත් කරනු ලැබුවේ නම්, එම පුද්ගලයන් ඉවත් කරන ලද පදනම කවරේද;

(v) 2010 ජූනි මාසයෙන් පසු සමෘද්ධිලාභීන් ලෙස අළුතින් එක් කරන ලද අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1156/'11

5.

ගරු බුද්ධික පතිරණ මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ,

(i) කුඩා තේ වගා බිම් ප්‍රමාණය කොපමණද;

(ii) කුඩා තේ වතු හිමියන්ගේ සංඛ්‍යාව කොපමණද;

(iii) එම ඉඩම් හිමියන්ගේ නම් සහ ලිපිනයන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත තේ වගාකරුවන් සඳහා පොහොර සහනාධාරය ලබා දෙන්නේද;

(ii) එසේ නම්, හෙක්ටයාර එකක් සඳහා රජය විසින් ලබා දෙනු ලබන සහනාධාර මුදල කොපමණද;

(iii) 2005 ජනවාරි සිට 2010 දෙසැම්බර් දක්වා කාලය තුළ මාතර දිස්ත්‍රික්කයේ කුඩා තේ වගාකරුවන්ට ලබා දුන් සහනාධාර පොහොර ප්‍රමාණය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම එක් එක් වර්ෂයේදී කුඩා තේ වගාකරුවන්ගේ වාර්ෂික නිෂ්පාදිතය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) පොහොර සහනාධාර දීමෙන් පසු නිෂ්පාදනය වැඩි වී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1540/'11

6.

ගරු අජිත් කුමාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හබරාදූව අධ්‍යාපන කොට්ඨාසයට අයත්, හරුමල්ගොඩ බටහිර කණිටු විදුහලේ වර්ෂ 2003 සිට 2010 දක්වා, එක් එක් වර්ෂය ආරම්භයේදී,

(i) ඒ ඒ ශ්‍රේණිවල සිටි සිසුන් සංඛ්‍යාව හා සම්පූර්ණ ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(ii) ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) පළමුවැනි ශ්‍රේණියට අයදුම්පත් යොමුකළ ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2004 න් පසු එම පාසලේ ප්‍රගතියක් ඇති වී තිබෙන බව පිළිගන්නේද;

(ii) එම ප්‍රගතිය සඳහා හේතු වූ කරුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?